## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2018

-------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට පටහැනිව භාණ්ඩාගාර වෙත නැවත හරවා යැවූ අරමුදල් රු.1,519,552 ක භාණ්ඩාගාර ප්‍රදාන ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක මග පෙන්වන්නන් හා පහසුකම් සලසන්නන් හට බෙදා දී නොතිබුණු රු.1,097,500 ක් වූ භාණ්ඩවල පිරිවැය සහ ප්‍රාග්ධනිත කළ යුතු රු.252,350 ක ප්‍රාග්ධන භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ වියදම් ලෙස දක්වා තිබුණි. | අවසන් තොගයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. | තොග ඇගයීම නිවැරදිව සිදුකර ඒ අනුව තොග පිරිවැය හඳුනාගත යුතු අතර ප්‍රාග්ධන භාණ්ඩ වත්කම් ලෙස ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දඩල්ල ප්‍රදේශයේ ඉදිකර ඇති අධිකාරියේ නව ගොඩනැගිල්ල හා ඊට සවිකර ඇති උපකරණ 2018 සැප්තැම්බර් 16 දින සිට භාවිතයට ගෙන තිබුණ ද, රු.66,661,502 ක් වූ එම වත්කම්වලට අදාල සමාලෝචිත වර්ෂයට ක්ෂය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | අදාල ගැලපුම් 2019 අවසාන ගිණුම්වල සිදුකෙරෙනු ඇත. | වත්කම් භාවිතයට ගත් දින සිට වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල රු. 1,450,372 ක් වූ පොලී ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | උපලබ්ධි වූ පසු ගිණුම්ගත කිරීම සිදුකෙරේ. | වර්ෂයට අදාල පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉදිරි වර්ෂයට අදාල රු.369,662 ක් වූ ස්භාවික සම්පත් ගවේෂණ බලපත්‍ර ගාස්තුව වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි. | 2019 අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතු යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල සිදු කරන ලද රු.3,765,107 ක අළුත්වැඩියා වියදම් වාහන අත්පත්කර ගැනීම් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් පිරිවැය හා ක්ෂය වියදම රු.1,807,248 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 අවසන් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අයභාර හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ (6) (ඇ) වගන්තිය | පනතේ ප්‍රධාන කාර්යයන් වලින් බැහැරව එකතු වන අපද්‍රව්‍ය පරීක්ෂා කර තහවුරු කර ගැනීමකින් තොරව සාගරයට බැහැර කර තිබූ අතර | අදාළ ආයතනවල නිසි සහයෝගය නොලැබීම මත අදාල ඉලක්ක වෙත ළඟාවීම ප්‍රමාද වී ඇත. | පනතේ සඳහන් බලතල ක්‍රියාත්මක කර මෙකී කටයුතු පාලනය කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අන්තරාකාරී ද්‍රව්‍ය වන සායනික අපද්‍රව්‍ය දිගු නල මගින් සාගරයට සෘජුව බැහැර කර තිබුණි. | | |
| (ආ) | 2018 අප්‍රේල් 29 දිනැති අංක MFAR/AD/2/ 10/01/01 (28) දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල තීරණය | (i) වෙරළාශ්‍රිත කලාපයේ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධිත සියලු ආයතන නියෝජනය වන පරිදි වෙරළ කලාපයේ අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවක් පිහිටුවීම. | ඉදිරියේදී දිස්ත්‍රික්ක මට්ටමින් හා පළාත්පාලන ආයතන මට්ටමින් කමිටු පිහිටුවා කටයුතු සිදුකරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයන් අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) ඩෙංගු මදුරු කීටයන් ජනනය වන ස්ථාන පවත්වාගෙන යන උපකරණ හා ගොඩනැගිලි හිමිකරුවන් පරිසර දූෂකයන් ලෙස හඳුනාගෙන ඔවුන්ට එරෙහිව ජාතික පරිසර පනත හා සමුද්‍රීය පරිසර දූෂණය වැලැක්වීමේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික, දිස්ත්‍රික්ක හා පාලාත් පාලන ආසන මට්ටමින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයන් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජුනි 06 දිනැති අංක අමප/18/0863/72 5/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | වරායන් ඇතුළු වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධ මෙහෙයුම් කටයුතු තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවට මුදල් හා ජනමාධ්‍ය ඇමතිගේ නිරීක්ෂණවලින් අවධාරණය කරනු ලැබ ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් ඒ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත්සභා, | ඉදිරියේදී දිස්ත්‍රික්ක මට්ටමින් පළාත්පාලන ආයතන මට්ටමින් කමිටු පිහිටුවා කටයුතු සිදුකරනු ඇත. | පෙන්වාදී ඇති කරුණු සම්බන්ධයෙන් වන කටයුතු ඉටු කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතන වලට නියම කිරීමට අදාල ක්‍රියාමර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පළාත්පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම කළ යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) | 2013 ජුනි 28 දිනැති අංක 37/1816 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | මෝදර හා වැල්ලවත්ත ස්ථානවලින් අපද්‍රව්‍ය සාගරයට බැහැර කිරීමට අදාල ගැසට් පත්‍රයේ සඳහන් දෙවන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙම ප්‍රදේශවල දූෂණය ඉතාමත්ම අධිකව පවතින බැවින් එම දූෂණයන් අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 15 වන වගන්තිය | නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපවත්වා අඛණ්ඩව වැටුප් වර්ධක අනුමත කර ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී විභාග සමත්වීම මත පමණක් වැටුප් වර්ධක ලබාදීමට වගබලා ගනු ලැබේ. | වැටුප් වර්ධක ගෙවීමේදී නියමිත කාලය තුළ අදාල විභාග පැවැත්විය යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.665,553 ක් වූ චෙක්පත් 14ක සම්බන්ධයෙන් මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.27, 476,884 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 35,611,914 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.63,088,798 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු.67,001,741 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| Bhoomi Tech (Pvt) Ltd වෙතින් 2017 ජනවාරි 31 දින ලද රු. 5,800,000 ක් වටිනා Flame and Furnace Combined AAS විද්‍යාගාර උපකරණය මීයන් කෑම හේතුවෙන් නැවත අළුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි වී ඇති අතර මෙම උපකරණය අධිකාරිය විසින් එක් වරක්වත් භාවිතයට ගෙන නොතිබුණි. මේ අනුව අනාරක්ෂිත ලෙස වටිනා විද්‍යාගාර උපකරණ ගොඩගසා තැබීම හේතුවෙන් රාජ්‍ය මුදල් අවභාවිතා වී ඇති බව නිරීක්ෂණය විය. | නැවත යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | වත්කම්වල ආරක්ෂාව සම්බන්ධව කළමනාකරණය වගකිවයුතු අතර වත්කම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මීගමුව ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන වෙරළ කළමනාකරණ වැඩසටහන යටතේ කැළණි ගං මෝයේ සිට මා ඔය දක්වා ප්ලාස්ටික් බෝතල් එකතු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණද එය ක්‍රියාත්මක වී නොතිබුණි. | නැවත මිල ගණන් කැඳවීමට තීරණය කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන සමුද්‍රිය පරිසරය දූෂණය වන ක්‍රමවේද හඳුනාගැනීම තුළින් එය අවම කිරීම සඳහා ජාතික උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම අධිකාරිය විසින් කෙටුම්පත් කර තිබුණද එහි ඉදිරි පියවරයන් මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | අවශ්‍ය කටයුතු සිදුකරගැනීමට කටයුතු යොදා ඇත. | කඩිනමින් අවශ්‍ය පියවරයන් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රදේශීය කාර්යාල මගින් ආවරණය වන ප්‍රදේශවලට අයත් කලාපවල බලපත්‍ර ලබාගත යුතු ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමේ දුර්වලතාවය හේතුවෙන් සමුද්‍රය අවට ප්‍රදේශවල ඇති ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීම අවම වී තිබීම. | බලපත්‍ර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය කාර්යයක් කිරීමට කටයුතු කර ඇත. | කඩිනමින් අවශ්‍ය පියවරයන් ගත යුතුය. |
| (ඇ) | මීගමුව කාර්යාලය තුළ ලැප්ටොප් පරිගණකයක් හා සංචාරක පුටු 07 ක් අබලි භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණද එම භාණ්ඩ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කෙරේ. | අබලි භාණ්ඩ ලෙස හඳුනාගෙන ඇති වත්කම් කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය මගින් ආවරණය කිරීමට ඇති කිලෝමීටර් 320 ක් වූ මුහුදු බඩ ප්‍රදේශය හඳුනා ගැනීමට අවශ්‍ය ජීපීඑස් උපකරණය ලබාදී නොතිබුණි. | 2019 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ජීපීඑස් යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කරනු ලැබේ. | උප කාර්යාලය සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු බව. |
| (ආ) | දිවයින වටා අපජලය බැහැර කිරීමේ බලපත්‍ර ලබාගත යුතු තත්ත්වයේ පවතින හෝටල් සංඛ්‍යාව 473 ක් වන අතර ඉන් හෝටල් 257 ක් අදාල බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍ර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීමට කටයුතු කර ඇත. | අදාල පරීක්ෂාවන් කඩිනමින් සිදුකර බලපත්‍ර ලබාදීම තුළින් කටයුතු නියාමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය කාර්යාල හා අදාල පළාත් පාලන ආයතන සමඟ එක්ව අපද්‍රව්‍ය මුහුද වෙත බැහැරවන කාණු හා ඇල පද්ධති හඳුනාගෙන තිබූ අතර එම පළාත් පාලන ආයතන හා සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | අදාල පරීක්ෂාවන් කඩිනමින් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අප ජලය බැහැර කිරීමට අදාල බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 34 ක් හඳුනාගෙන තිබුණද ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | බලපත්‍ර ලබාදීම කඩිනමින් සිදුකර ඉදිරි කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | එක් එක් ප්‍රාදේශීය කාර්යාලයට අයත් බල ප්‍රදේශ තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා (ඩම්පින්) බලපත්‍ර ලබාගත යුතු නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකරන ආයතන පිළිබඳව වාර්තා කැඳවා නීති අංශය මගින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | නීති අංශයට නිලධාරීන් අනුයුක්ත කර අදාල ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ඊ) | නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් පිටකරන ජලය උෂ්ණත්වයෙන් අධිකවීමත්, ගල් අඟුරු බෑමේදී මුහුදට ගල් අඟුරු වැටීමත් හේතුවෙන් පාරිසරික හා සාගර දූෂණය සිදුවන නමුත් මෙය අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් අධිකාරිය විසින් ගෙන නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | පාරිසරික හා සාගර දූෂණය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (උ) | තංගල්ල කහද මෝදර හෝටලයකින් අපද්‍රව්‍ය සාගරයට බැහැර කිරීම හා වරාහේන පොදු මල අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඇති වී ඇති පරිසර දූෂණය සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | පාරිසරික හා සාගර දූෂණය අවම කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග යුතුය. |
| (ඌ) | ධීවර වරායන්හී පවතින අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී ආයතනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | අධිකාරියේ ප්‍රධාන වගකීමක් ලෙස සලකා අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ සීමාවේ මුහුදට අපද්‍රව්‍ය බැහැරවන ආකාරයෙන් තනා ඇති වැසිකිළි හා අපද්‍රව්‍ය යලි ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දැමීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දමන අපද්‍රව්‍ය හේතුවෙන් සංචාරක කර්මාන්තයට විශේෂ බලපෑමක් විය හැකි බැවින් එම ගැටළුව සම්බන්ධව සංචාරක සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කොට ඉදිරියේදී ක්‍රියාකළ හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් සකස් කිරීමටත් තීරණය කළද එය ඉටුකර නොතිබුණි. | පළාත්පාලන ආයතන දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල වාර්තාව කඩිනමින් ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හලාවත උප කාර්යාලයේ තිබූ වටිනාකම රු.28,000ක් වූ ජීපීඑස් (GPS)යන්ත්‍රයක් අස්ථාන ගතවී තිබූ අතර ඒ සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විමර්ෂණ කමිටුවක් පත්කර ඇත. | මූලික පරීක්ෂණ හා විධිමත් පරීක්ෂණ කඩිනමින් කළ යුතුය. |
| (ආ) | වාර්ෂික පුහුණු සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත්ව නොතිබුණු ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් සඳහා රු.1,017,045 ක් ශ්‍රී ලංකා පදනම් ආයතනයට ගෙවා තිබුණි. පුහුණු අවශ්‍යතාවය, අපේක්ෂිත වියදම හා සම්පත් දායකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් රජයට වඩාත්ම වාසිදායක හා පිරිවැය අවම කරමින් සිදු කිරීම කෙරෙහි අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව අවම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. | ආයතනයේ අවශ්‍යතාවලට අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගාල්ල කාර්යාලයට රු.2,197,998 ක් වැයකර ස්ථාපිත කරන ලද විද්‍යාගාරයේ කටයුතු වෙනුවෙන් පුහුණු කරන ලද නිලධාරියා එම කාර්යාලට අනුයුක්ත නොකිරීම නිසා විද්‍යාගාරය ස්ථාපිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | සමාන සුදුසුකම් ඇති සමුද්‍ර පරිසර නිලධාරියෙකු අනුයුක්ත කර ඇත. | අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ යුතුය. |
| (ඈ) | සමුද්‍රීය පරිසර ආරක්ෂණය කරමින් සමුද්‍ර දූෂණය අවම මට්ටමක පවත්වා ගැනීම උදෙසා හා ප්‍රාදේශිය කාර්යාලවල ගුණාත්මකභාවය වැඩි කරමින් කාර්යාල සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 71 අනුව නව සමුද්‍ර පරිසර නිලධාරී තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරගෙන තිබුණද, නිලධාරීන් එම ප්‍රාදේශීය කාර්යාල වලට අනුයුක්ත කිරීම දුර්වල මට්ටමක පවතින බව විගණනයට නිරීක්ෂණයට විය. | අනුමත කාර්යමණ්ඩලය බඳවාගෙන ඉදිරියේදී ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කෙරේ. | බඳවාගත් නිලධාරීන් ඒ ඒ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් (Procurement Plan) සකස් කර ඊට අදාල ක්‍රියාත්මක සැලැස්මක් සකසා තිබුණත් පසුව ඒ සඳහා (Major Procurement රු.මිලියන 41,166 ක් ද Minor Procurement රු.මිලියන 3,285 ක් ද වන සේ රු.මිලියන 44,451) සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. එමගින් විශාල ප්‍රමාණයේ ප්‍රසම්පාදනයන් 42 ක් හා සුළු ප්‍රසම්පාදනයන් 29 ක් යටතේ මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද සංශෝධිත සැලැස්ම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් | අදාල වගකිවයුතු නිලධාරීන්ට දැනටමත් උපදෙස් ලබාදී ඇත. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. මුල් සැලැස්මට අදාලව පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 අගෝස්තු වන විට සියළු විශාල මිලදීගැනීම් සියල්ල අවසන් විය යුතු වුවද විගණනයට ලද තොරතුරු අනුව ප්‍රසම්පාදනයන් සිදු කර නොතිබුණි. | | |
| (ආ) | අනුමත ප්‍රසම්පාදන සැලැස්ම යටතේ 2018 සැප්තැම්බර් 11 දක්වා වූ මිලදී ගැනීම්වල ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස කරන ලද ඉල්ලීමට අධිකාරිය විසින් තොරුතුරු සපයා නොතිබීම නිසා අපේක්ෂිත ඉලක්ක සපුරාගත් බවට තහවුරු කරගත නොහැකි විය. | අදාල වගකිවයුතු නිලධාරීන්ට දැනටමත් උපදෙස් ලබාදී ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරාගත් ආකාරය දැක්වෙන ලෙස ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධායක කළමනාකරණ මට්ටමේ තනතුරු පස් දෙනෙකු වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩු වී තිබූ අතර ඉන් නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | මේ දක්වා බඳවා ගැනීම් සිදුකර නැත. | ස්ථිර කාර්යමණ්ඩල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය අනුව අභ්‍යන්තර විගණන අංශය සඳහා විගණන නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | අධිකාරිය සතුව ප්‍රාදේශීය කාර්යාල 09 ක් ඇති බැවින් අභ්‍යන්තර විගණන අංශයේ කාර්යමණ්ඩලය වැඩි කළ යුතුය. |

### 4.2 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වුවද එම කමිටුවේදී ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | අදහස් දක්වා නැත. | විගණන කමිටුව විසින් ගනු ලබන තීරණයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුසපාඩුව ප්‍රදේශයේ සාගර වෙරළ ආශ්‍රිත භූමියකට හලාවත නගරසභාව විසින් නිසි ක්‍රමවේදයකින් තොරව අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම සහ ගිනි තැබීම හේතුවෙන් කඩොලාන පරිසර පද්ධතියට සහ ජෛව පද්ධතියට හානි සිදුවී තිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කමිටුවක් පත්කර ඇති අතර අවශ්‍ය වාර්තාව සකස් කරමින් පවතී. | කඩොලාන පරිසර පද්ධතියට සහ ජෛව පද්ධතියට සිදුවන හානිය අවම කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොඩබිම හා මුහුද ආශ්‍රිතව සිදුවන විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන සමුද්‍ර දූෂණය පිළිබඳ නිවැරදි දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මගින් සමුද්‍ර | නීතිමය කටයුතු කිරීමේ අපහසුතාවයක් පවතී. | නියමිත පරිදි දුර්වල අවස්ථා හඳුනාගෙන පනතේ ප්‍රතිපාදනවලට අනුව ඊට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දූෂණය වැළැක්වීම සඳහා වන තීරණ ගැනීම සහ දූෂණය අවම කිරීමට කටයුතු කිරීම සිදුකළ යුතු වන අතර 2017 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව BSWQI වර්ග කිරීම මගින් කාර්තු වශයෙන් නාන තොටුපලවල ජලයේ ගුණත්වය ශ්‍රේණිගත කර තිබුණි. එහිදී ඉතා දූර්වල අවස්ථා 01 ක් ද, දූර්වල අවස්ථා 06 ක් ද නිරීක්ෂණය විය. මේ අතරින් වැඩි වශයෙන්ම ගල්කිස්ස හා වැල්ලවත්ත මුහුදු තීරයේ ජලයේ ගුණත්වය ඉතා පහළ මට්ටමක පවතින බව අදාළ වාර්තාව අනුව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | මාදම්පිටිය පිරිපහදු පොම්පාගාරය වෙත පිටස්තර ආයතනවල මළ සහ අපජලය රැගෙන එනු ලබන බවුසර් අතරින් කිහිපයක පීඑච් අගය පමණක් පරීක්ෂණයට ලක්කර තිබුණු අතර විද්‍යාගාරයේ කාර්යමණ්ඩලය ලෙස එක් නිලධාරිණියක් පමණක් අනුයුක්ත කර තිබුණි. | කොළඹ නගර සභාවෙන් අවශ්‍ය සහයෝගය නොලැබුණු බැවින් එය ක්‍රියාත්මක නොවුණි. | නියමිත පරිදි දුර්වල අවස්ථා හඳුනාගෙන ඊට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන සමුද්‍රිය පරිසරය දූෂණය වන ක්‍රමවේද හඳුනාගැනීම තුළින් එය අවම කිරීම සඳහා ජාතික උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම අධිකාරිය විසින් කෙටුම්පත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එය වඩාත් ඵලදායී ලෙස පිළියෙල කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීමට 2018 ජුනි 22 දින දන්වා තිබුණද එහි ඉදිරි පියවරයන් නිරීක්ෂණය නොවුණි. | ධීවර වරායන්හී අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සකස් කරමින් පවතී. | නියමිත පරිදි දුර්වල අවස්ථා හඳුනාගෙන ඊට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | දිවයින වටා ධීවර වරායන් 25 ක් පවතින අතර ඒ මගින් විශාල ලෙස අපද්‍රව්‍ය හා අප ජලය සමුද්‍රයට එක් වේ. අප ජලය පිරිපහදු පද්ධති නොමැති වීමත් ධීවර පරිශ්‍රයන් තුළ ධීවර බෝට්ටු අළුත්වැඩියාවන් හා තීන්ත ආලේපන කටයුතුද අත් හරින ලද ධීවර ආම්පන්න ආදිය මගින්ද අධික ලෙස සමුද්‍රය දූෂණයට ලක්වන බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය ලේකම් මගින් අවශ්‍ය කටයුතු සිදුකර ගැනීමට කටයුතු යොදා ඇත. | දූෂණය අවම කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා දර්ශක 05 ක් හඳුනාගෙන තිබූ අතර එය එක්සත් ජාතීන්ගේ අවධානය සඳහා යොමුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා ලැබිය යුතු උපදෙස් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. | අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා සියළුම රාජ්‍ය ආයතන කටයුතු කිරීම අනිවාර්ය බැවින් ඒ සඳහා කඩිනමින් පියවර ගත යුතුය. |